

මිහන්ෂා සිතුමිණි කොටන්දෙණිය

උඳුවැල් බණ්ඩියා

මිහන්ෂා සිතුමිණි කොටන්දෙණිය

ISBN 978-624-208-634-7

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකෝමත් එක කාලෙක බණ්ඩි කියලා ළමයෙක් හිටියා. බණ්ඩියාගේ බඩ කලගෙඩියක් වගේ. මොකද බණ්ඩියා හොඳට කෑම කන නිසා. දැන් අවුරුද්දත් ළඟ නිසා එරබදු ගහ ළඟ බණ්ඩියාගේ තාත්තා ඔන්චිල්ලාවක් බැදලා දුන්නා. බණ්ඩියා එදා මුළු දවසම ඔන්චිල්ලාවෙ තමයි හිටියේ.

ඉතින් අවුරුද්දත් ළඟ නිසා බණ්ඩියාගේ ආච්චි උඳුවැල් හදන්න පටන් ගත්තා. ආච්චි කැවුම් හදද්දී බණ්ඩියාවනම් ළඟට ගන්නේ නැහැ. මොකද බණ්ඩියා උඳුවැල් කන්න ආසයි. බණ්ඩියාගේ ආච්චි බණ්ඩියාව ළඟට ගත්තොත් උඳුවැල් ටික ඔක්කොම කාලා දානවා.



මෙහෙම ආච්චි උඳුවලළලු හද හද ඉද්දී ටික වෙලාවකින් ආච්චිට බණ්ඩියාව මතක් වුණා. ආච්චිට හිතුනා බණ්ඩි බබාට දැන් හොඳටම බඩගිනි ඇති කියලා. ආච්චි බණ්ඩියාට කතා කළා. බණ්ඩියාට හිතුනා ආච්චි කතා කළේ උඳුවැල් කන්න තමා කියලා. ඉන්න ආච්චි මම ටක්ගාලා එනවා, බණ්ඩි බබා කිවුවා.





ආච්චි බණ්ඩියාට උඳුවැලක් දුන්නා. තවත් උඳුවැලක් බණ්ඩියා ඉල්ලුවා. ආච්චි තවත් උඳුවැලක් දුන්නා. උඳුවැල් හරිම රසයි ආච්චි. තවත් උඳුවැලක්, ආච්චි බණ්ඩි බබාට කිවුවා උඳුවැල් ටික ඔක්කොම කෑවොත් අවුරුද්දට කෑම මේසෙට මොනවද තියන්නේ කියලා. බණ්ඩියා දුකින් එළියට ගියා.

ආච්චි උඳුවැල් හදලා ඉවර වුණාට පස්සෙ උඳුවැල් ටික මුට්ටියකට දාලා මුට්ටියේ කටත් වහලා මුට්ටිය ටිකක් උඩ රාක්කයක ආච්චි අම්මා තිබ්බා. බණ්ඩියා ආච්චි අම්මා උඳුවැල් මුට්ටිය කොහෙද තියෙන්නේ කියලා හොරෙන් බලාගෙන හිටියා.





ආච්චිට උඳුවැල් හදලා මහන්සි නිසා නිදිය ගත්තා. ආච්චි ගියාට පස්සේ බණ්ඩියා හොරෙන් හොරෙන් උඳුවැල් මුට්ටිය ගාවට ගියා. බණ්ඩියා කොට නිසා උඳුවැල් මුට්ටිය ළඟට යන්න බැරි වුණා. බණ්ඩියා පුටුවක් ඇරගෙන ඒකට නැග්ගා. එතකොට උස ඇති වුණා. උඳුවැල් ටික කාගෙන කාගෙන ගියා.

බණ්ඩියාට දැණුනා කවුදෝ මගේ කට කනවා කියලා. බණ්ඩි බබා හයියෙන් අඬ අඬ හිටියා. එතකොටම ''දඩිං'' කියලා පුටුවත් එක්කම බිමට වැටුණා. මුට්ටියයි රාක්කයේ තිබ්බ බඩුයි ඔක්කොම බිමට වැටුණා. ආච්චිට සද්දයක් ඇහුනා. ආච්චි ඉක්මණින්ම ආවා. බණ්ඩියාගේ කට රතුම රතුයි. ආච්චිට තේරුණා බණ්ඩියාගේ කට කූඹි කාලා කියලා. බණ්ඩියාගෙන් ආච්චි ඇහුවා ඇයි මේ කියලා. බණ්ඩියා ඔක්කොම විස්තරේ කිව්වා.





ආච්චි කිවුවා ආයනම් පෙරේතකමට හොරෙන් කන්න එපා කියලා. බණ්ඩියාට ටිකක් බයයි වගේ මොකද මුට්ටිය කැඩුණ නිසා. බණ්ටි බබා කිවුවා ආයනම් හොරෙන් කන්නෙ නෑ කියලා.

අවුරුද්දත් ආවා, ආච්චියි බණ්ඩියයි ලස්සන කැවිලි මේසයක් හැදුවා. බණ්ඩියා වෙනදාට වගෙ නෙවෙයි අද උදෙන්ම නැගිට්ටා. පවුලේ හතර දෙනාම අවුරුද්ද සැමරුවා. ආච්චියි, අම්මයි, තාත්තයි බණ්ඩියාට තෑගි බෝග දුන්නා.





බණ්ඩියා ආච්චිටයි, අම්මටයි, තාත්තටයි බුලත් දීලා වැන්දා. බණ්ඩියාගේ පවුලේ අයත් එක්ක නැකතට කිරි උතුරලා කෑම මේසෙට ගිහින් කෑම කාලා විනෝද වුණා. බණ්ඩි බබා ආය කවදාවත් වැරදි වැඩ කළේනම් නෑ. මෙහි ආදර්ශය වන්නේ පුංචි අපිත් නරක වැඩ කරන්නේ නැතිව හොද වැඩ කිරීමයි. හොඳ වැඩ කිරීමයි. හොඳ වැඩ කරන ළමුන්ට කවුරුත් කැමතියි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්